**unit 03**

# රාජ්‍යයේ ස්වභාවය

වාගීෂ්වර

## 3.3 රාජ්‍යය හා සම්බන්ධ දේශපාලන සංකල්ප

- රාජ්‍යය , ජාතිය , ජාතිකත්වය හා ජනවාර්ගිකත්වය
- රාජ්‍යය හා සමාජය
- රාජ්‍යය හා ආණ්ඩුව
- රාජ්‍යය සහ අනෙකුත් සමාජ සංවිධාන

sureka wageeshwara

# රාජ්‍යය හා ජාතිය

# රා ජ්‍යය , ජාතිය , ජාතිකත්වය හා ජනවාර්ගිකත්වය

හැඳින්වීම

රාජ්‍යය, ජාතිය, ජාතිකත්වය හා ජනවාර්ගිකත්වය බොහෝ විට පොදු සමාන අර්ථ සහිතව භාවිතා වනු දැකිය හැකිය. නමුත් රාජ්‍යය, ජාතිය, ජාතිකත්වය සහ ජනවාර්ගිකත්වය යන වාක් සංකේත වෙනස්කම් සහිත ඒවා වේ.

**රාජ්‍යය යනු,**

- නිශ්චිත භූමිය , ජනසංඛ්‍යාව , ආණ්ඩුව , ස්වාධිපත්‍ය බලය,
 යන ලක්ෂණයන්හි එකතුවක් ලෙස හැඳින්විය හැකිය.
- රාජ්‍යයට අදාළ නිර්වචන ද මෙහිදී සඳහන් කළ හැකි ය.

- <u>රාජ්‍යයන් සඳහා නිදර්ශන</u>

**එංගලන්තය** - **ප්‍රංශය** මුල්ම ජාතික රාජ්‍යයන් වන අතර පසුව ස්පාඤ්ඤය - පෘතුගාලය- ඉතාලිය - ජර්මනිය - ඉන්දියාව ආදී වශයෙන් නූතන ලෝකය තුළ 200 ට ආසන්න ජාතික රාජ්‍යයන් ප්‍රමාණයක් පෘථිවි තල සිතියම තුළ නිර්මාණය වී පවතී.

**ජාතිය යනු කුමක්දැයි හඳුනා ගැනීම.**

- <u>ජාතිය නැමති වාක් සංකේතය නිර්මාණය වීමට අදාල තත්ත්වයන්</u>

ලතින් භාෂාවේ ''<u>උත්පත්තිය</u>'' යන අර්ථය දීම සඳහා භාවිත කළ <u>''නේට්‍රුස්''</u> (Natio) යන පදය ඉංග්‍රීසි භාෂාවට <u>''නේෂන්</u> (<u>Nation</u>)'' ලෙස බිඳී ආ අතර නේෂන් (Nation) යන්නෙහි සිංහල අර්ථය <u>"ජාතිය"</u> යි.

- <u>ජාතිය යනු කුමක්දැයි අර්ථකතනය කිරීම.</u>

නූතන ජාතික රාජ්‍යය නිර්මාණයවීමට අදාළ <u>ජන සංඛ්‍යාව</u> සරලව ජාතියක් ලෙස අර්ථකතනය කළ හැකිය.

- <u>ජාතිය යනු කුමක්දැයි හඳුනා ගැනීමට අදාල පොදු නිර්වචන</u>

**"කිසියම් භූමියක් තුළ දේශපාලන නිදහස , ස්වාධීනත්වය භුක්තිවිඳින හෝ භුක්තිවිඳීමට අපේක්ෂා කරන ජනතාවක් ජාතියක් වේ."**

**"කිසියම් භූමියක් තුළ දේශපාලන වශයෙන් සංවිධානගත වූ හෝ දේශපාලන වශයෙන් සංවිධාන ගතවීමට අපේක්ෂා කරන ජනතාවක් ජාතියක් වේ."**

"නිශ්චිත භූමි ප්‍රදේශයක් තුළ යම් අරමුණක් කරා ස්වයං පාලනය මෙහෙයවන සංස්කෘතික ලෙස සමාන ලක්ෂණ පෙන්නුම් කරන බොහෝ විට එක් භාෂාවක් කථා කරන ජන කණ්ඩායමක් ජාතියක් වේ."

"සිය ස්වාධීනත්වය රැක ගැනීමේ ශක්තියත් එකම මධ්‍ය ආණ්ඩුවක පාලනයට යටත්ව ජීවත් වන ජනතාවක් ජාතියක් වේ."

- <u>ජාතියක් යනු කුමක්දැයි හඳුනා ගැනීමට අදාළ දාර්ශනික නිර්වචන</u>

"ස්වාධීන හෝ ස්වාධීනත්වය අපේක්ෂා කරන දේශපාලන කණ්ඩායමක් ලෙස සංවිධානය වූ මිනිස් සමූහය ජාතියක් වේ"

-බ්‍රයිස් සාමි වරයා-

"එක්සත්කම හා රාජ්‍ය පිළිබඳ ස්වාධීනත්වය ලබාගත් මිනිස් සමූහයක් ජාතියක් වේ"

-හේස් -

"ජාතිය යනු පොදු භාෂාවක්, පොදු දේශයක් ,පොදු ආර්ථික බන්ධනයන් හා ඓතිහාසික හැඟීම් පදනම්ව ගොඩ නැගුණු පොදු සංස්කෘතියක් ඇතිව ඓතිහාසිකව විකාශනය වූ මිනිස් සමාජය වේ"

- ස්ටාර්ලින් -

- <u>ජාතිය පිළිබඳ සංකල්පයේ **ඉතිහාසය**</u>

ජාතිය පිළිබඳ සංකල්පය වඩාත් තීව්‍ර ලෙස සංවාදයට බඳුන් වීම <u>20 වන සියවස මුල් භාගයේ</u> පටන් සිදුවිය. දෙවන ලෝක මහා සංග්‍රාම පශ්චාත් අවධිය තුළ ලොව පුරා ක්‍රියාත්මක වූ <u>යටත් විජිත හරණය</u> ඊට අදාළව ප්‍රබල සංධිස්ථානයක් විය. ජාතියකට අදාල පදනම ප්‍රධාන වශයෙන් දේශපාලනිකව <u>මධ්‍යගත ආණ්ඩුව</u> පිළිබඳ භාවිතාවන් සමගින් නිර්මාණය වේ. මධ්‍යගත ආධිපත්‍යයක් සහිත රාජ්‍යයක් පිළිබඳ කතිකාව මෑතකදී නිර්මාණය වූවක් වන අතර 16 වන සියවසට පෙර කිසිවෙකු එවැන්නක් පිළිබඳව දැන නොසිටි බව දේශපාලන විද්‍යා ලිඛිත සාහිත්‍යයමය මූලාශ්‍ර තුළ සඳහන් වේ.

## ජාතිකත්වය යනු කුමක්දැයි හඳුනා ගැනීම.

- <u>ජාතිකත්වය නැමති වාක් සංක්තය නිර්මාණය වීම.</u>

ලතින් භාෂාවේ "<u>උත්පත්තිය</u>" යන අර්ථයෙන් භාවිතා කළ "(<u>Natio</u>) <u>නේට්‍රස්</u>" යන පදය <u>ඉංග්‍රීසියට</u> "(<u>Nation</u>) <u>නේෂන්" ලෙස බිඳී එයි.</u> එහි සිංහල අර්ථය ජාතිය යි. <u>ඉංග්‍රීසිය තුළ නේෂන් (Nation) නැෂනල්ටි ( Nationalty)</u> දක්වා ව්‍යාප්ත වන අතර එහි සිංහල අර්ථය ජාතිකත්වය යි.

- <u>ජාතිකත්වය යනු කුමක්දැයි අර්ථකතනය කිරීම.</u>

"ජාතිකත්වය මනෝභාවයකි. එනම් එය මානසික සිතුවිල්ලකි. <u>රටක ජනතාවක් තුළ ජාතිය පිළිබඳ උත්පාද හැඟීම ජාතිකත්වය තුළින් විස්තර වේ.</u> තවදුරටත් සරල කරනුයේ නම් **තමන් එකම ජාතියකට අයත් වනු යේ යැයි යන මානසික සිතුවිල්ල ජාතිකත්වයයි**"

- <u>ජාතිකත්වයට අදාළ නිදර්ශන</u>

ලාංකිකයන් යන හැඟීම.
ඉන්දියානුවන් යන හැඟීම.
ඇමරිකානුවන් යන හැඟීම.
කියුබානුවන් යන හැඟීම.

- <u>ජාතිකත්වය පිළිබඳ හැඟීම වර්ධනය වීමට බලපාන සාධක කිහිපයකි.</u>

වාර්ගිකව පවතින සමාන බව.
පොදු වාසස්ථානයන් හි ජීවත් වීම.
පොදු භාෂාව.
පොදු ආගම.
පොදු ඉතිහාසයක් පැවතීම.
පොදු අවශ්‍යතාවන්ගෙන් යුක්ත වීම.
පොදු සංස්කෘතික සම්ප්‍රදායන් හා සිරිත් විරිත් පැවතීම.

**<u>ජාතිය හා ජාතිකත්වය අතර ඇති බැඳීම.</u>**

ජාතිය හා ජාතිකත්වය භාෂා විද්‍යාත්මක අරුත් තුළ මෙන්ම න්‍යායික අර්ථය තුළද අති සමීපතා සහිත වාක් සංකේත යුග්මයකි. සරලව දක්වන්නේ නම් , **ජාතිය හා ජාතිකත්වය එකම කාසියක දෙපැත්තකි.**

"මිනිසුන් ජාතියක් වශයෙන් කල්පනා කරන විටදී ඔවුන් ජාතියක් බවට පත්වේ"
-එර්නස්ට් බාකර්-

"දේශපාලනික වශයෙන් සංවිධානය වූ ජාතිකත්වය ජාතියයි"
-බ්‍රයිස් සාමි වරයා-

"රාජ්‍යය හා ජාතිකත්වය එකට ඒකරාශී වූ විට ජාතියක් නිර්මාණය වේ"
-මහාචාර්ය ගානර්-

## ජනවාර්ගිකත්වය යනු කුමක්දැයි හඳුනාගැනීම.

ජාතිය හා ජාතිකත්වය යන සංකල්ප ක්‍රියාත්මක වීමට ඇති බාධාව වන්නේ ජනවාර්ගිකත්වයයි. **එකම ජාතික රාජ්‍යයක් තුළ විවිධ ජන වර්ග ජීවත් වීම සිදුවිය හැකිය. විවිධ ආගම් , විවිධ භාෂාවන් සහ විවිධ වූ සංස්කෘතික ජිවිතයන් සහිත ජන වර්ග ජීවත් වීමේදී එකී ජනතාව ස්වකීය ජන වර්ගයේ පදනම මත ක්‍රියාත්මක වන විට ජනවාර්ගිකත්වය උත්පාද වේ.** එවිට එකම ජාතික රාජ්‍යයක් තුළ වුවද විවිධ ජනවාර්ගිකත්වයන් පැවතිය හැකිය. ජනවාර්ගිකත්වය තුළ ඒ ඒ වාර්ගික කොටස් වලට අනන්‍ය වූ භාෂාමය ,ආගමික, සංස්කෘතික, ඓතිහාසික උරුම , අනාගත අපේක්ෂාවන් වැනි පොදු ලක්ෂණයන් ඉස්මතු වී වර්ධනය විය හැකිය.

- ජනවාර්ගිකත්වයට අදාළ නිදර්ශන

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකාව තුළ | - | සිංහලය යන හැඟීම දමිළ යන හැඟීම මුස්ලම් යන හැඟීම. |
| ඇමරිකාව තුළ | - | කලු වාර්ණිකයන් ය යන හැඟීම, සුදු වාර්ණිකයන් යන හැඟීම, කහ වාර්ණිකයන් යන හැඟීම. |

මෙම ජනවාර්ගිකත්වය රටක් තුළ ජාතික හා ජාතිකත්ව සංකල්ප ගොඩ නැගීමට සුවිශාල බාධාවකි.

**ජාතිය හා ජාතිකත්වය පිළිබඳ සංකල්ප අවභාවිතාවන්ට ලක් වීම.**

නූතන ජාතික රාජ්‍ය සංකල්පය තුළ ජාතිය හා ජාතිකත්වය පිළිබඳ සංකල්ප ඉතා වැදගත් වටිනාකමක් සහිත ඒවා ලෙස ඉස්මතු වී ක්‍රියාත්මක වුවද ජාතිය හා ජාතිකත්වය පිළිබඳ සංකල්ප බොහෝ ලෙස අවභාවිතාවන්ට ලක් වීමක්ද දක්නට ලැබේ. ඊට අදාළ **නිදර්ශන.**

- ★ ශුද්ධත්වය පිළිබඳ සංකල්පය ඉස්මතු කරමින් ජාතිය යුධ උන්මාදයක් කරා මෙහෙය වීම. (ජර්මනියේ හිට්ලර්)
- ★ ජාතිය පිළිබඳ ඇතිවන අධිමානී හැඟීම සහ ස්වකීය ජාතික සංස්කෘතීන් පිළිබඳ උත්පාදකර ගන්නා මානව කේන්ද්‍ර ආකල්පයන් මත ගෝලීය සහයෝගීතාවය අර්බුදයට පත් වීම.
- ★ ජාතිය හා ජාතිකත්වය මත පදනම නිර්මානය වන උග්‍ර ජාතිවාදී හැඟීම් අන්තර්ජාතික සාමයට බාධාකාරී වීම.
- ★ ජාතිය හා ජාතිකත්වය පිළිබඳ සංකල්පයන්ට මුවා වී හුදු ආත්මාර්ථකාමී පෞද්ගලික දේශපාලනික න්‍යාය පත්‍රයන් ක්‍රියාවට නංවාගැනීම.

- ★ ස්වකීය රාජ්‍යත්වය පිළිබඳව පෞද්ගලික අභිමතාර්ථ මුදුන් පමුනුවා ගැනීමේදී ජාතිය අලෙවි කිරීම. <u>ජාතික ඇඳුම, ජාතික කොඩිය, ජාතික සිරිත්</u> විරිත් වැනි දෑ ස්වකීය බලවාදී දේශපාලන ගමනේ ප්‍රදර්ශනාත්මක මෙවලම් ලෙසින් භාවිතා කිරීම.
- ★ වෙළඳ ප්‍රචාරක දැන්වීම් සඳහා ජාතිය හා ජාතිකත්වය පිළිබඳ සංකල්ප උපක්‍රමික ලෙස භාවිතා කිරීම.
- ★ බොහෝ රටවල දේශපාලනික අර්බුද සහ ආණ්ඩු විරෝධයන් වලක්වා ගැනීමට පාලකයන් විසින් ජාතිය හා ජාතිකත්වය අලෙවි කිරීම.

## රාජ්‍ය හා ජාතිය

### ■ <u>රාජ්‍ය හා ජාතිය සමාන එකක් ලෙස සැලකුම් ලබන තත්ත්වයන්</u>

<u>ප්‍රායෝගික ව්‍යවහාරය තුළ රාජ්‍ය හා ජාතිය යන වාක් සංකේත සතු සංකේතික</u> අර්ථ ඉතිහාසයේ සිට එකක් ලෙස හඳුනාගැනීමට බොහෝවිට මිනිසුන් පුරුදු වී සිටීම. බොහෝ විට සාහිත්‍ය කලා ලෝකය හා ජනප්‍රිය වාක් භාවිතාවන් තුළ රාජ්‍ය හා ජාතිය අතර වෙනස් නොපෙනේ.

<u>නූතන ජාතික රාජ්‍ය ක්‍රමය හමුවේද රාජ්‍ය හා ජාතිය අතර වෙනසක් නොපෙනේ.</u> නූතන ජාතික රාජ්‍ය බිහි වන්නේ එක් ජාතියක් සඳහා එක් රාජ්‍යයක් යන පදනමිනි. ශ්‍රී ලාංකිකයන් සඳහා ශ්‍රී ලාංකීය රාජ්‍යයත් ඉන්දියානුවන් සඳහා ඉන්දීයානු රාජ්‍යයත් ඇමරිකානු එක්සත් ජනපදිකයන් සඳහා ඇමරිකානු රාජ්‍යයත් ආදී ව ජාතික රාජ්‍ය සංකල්පය තුළදී රාජ්‍ය හා ජාතිය සම රූපී හැඩතල පෙන්වයි.

එමෙන්ම <u>අනතර් ජාතික සම්බන්ධතා සැලකූ විටදී රාජ්‍ය හා ජාතිය අතර වෙනසක් හඳුනාගත නොහැකි</u> <u>අතර එහිදී ද ප්‍රදර්ශනය වන්නේ සමානතාවයකි.</u> එනම් ජාත්‍යන්තර සම්බන්ධතා වලදී පුද්ගලයකු කුමන රාජ්‍යයක සාමාජිකයෙකුදැයි යන්න තීරණය කරන්නේ ජාතික පදනමකින් මිස වෙනත් වාර්ගික පදනමකින් නොවේ. එනම් <u>ජාත්‍යන්තර සම්බන්ධතා විෂය තුළ ලංකාවේ පුරවැසියෙක් ශ්‍රී ලාංකිකයකු ලෙස සලකනවා මිස සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් යන වාර්ගික පදනමකින් එම හඳුනාගැනීම සිදු නොකරයි.</u>

### ■ <u>රාජ්‍ය හා ජාතිය වෙනස් ඒවා ලෙස හඳුනාගත හැකි තත්ත්වයන්</u>

**මහාචාර්ය සීමර්** ප්‍රකාශ කරනුයේ <u>න්‍යායික තත්වයේ දී රාජ්‍ය හා ජාතිය අතර වෙනසක් පවතින බවයි.</u> **සීමර්ගේ විග්‍රහටය අනුව ,**

"රාජ්‍ය යනු දේශපාලනික දෙයක් වන අතර ජාතිය යනු මානසික දෙයක් වේ"

මේ අනුව කිසියම් මිනිසෙකු අයත් රාජ්‍ය දේශපාලනිකව තීරණය වන මුත් ඔවුන්ගේ ජාතිය තීරණය වන්නේ ඔහු කවර ජාතියකට අයත් වන්නේ දැයි ඔහුගේ මනස තුළ ඇතිවන මනෝභාවයන් මගිනි.

නිදර්ශන -

ශ්‍රී ලංකාව සිංහල - දමිළ - මුස්ලිම් යන බහුවිධ ජනවර්ගයන්ගෙන් යුතු ජාතික රාජ්‍යයක් වුවද බොහෝ සිංහලයන් තමන්ගේ ජාතිය පිළිබඳ හැඟීමේදී තමන් සිංහල ජාතිය බවත්, මුස්ලිම් වරුන් ස්වකීය ජාතිය පිළිබඳ හැඟීමේදී තමන් මුස්ලිම් වරු බවත්, දමිළයන් තමන් දමිළ ජාතිකයන් බවත් යන හැඟීමෙන් බොහෝ විට කල්පනා කරනවා මිස ඔවුන් සිය මනස තුළ ශ්‍රී ලාංකීය යන හැඟීම තබා ගන්නේ බොහෝ අල්ප වශයෙනි.

එසේම රාජ්‍යය හා ජාතිය අවනත භාවය මතද වෙනස් වේ. මෙහිදී අවනතභාවය පිළිබඳව පුරවැසියා ගේ බැඳීම මෙසේ විග්‍රහ කළ හැකිය. රාජ්‍යයක පුරවැසියෙක් අනිවාර්ය ලෙසම ස්වකීය ජාතික රාජ්‍යයට අවනත විය යුතුය. එය බොහෝවිට බලය මත පදනම් වී සිදු වන්නකි. රාජ්‍යයට පුරවැසියාගේ ජීවිතය හා මරණය අතර සියළු තීන්දු ගත හැකි නිසාවෙන් පුරවැසියා රාජ්‍යයට අවනත වීම අනිවාර්යයෙන්ම සිදුවේ. එය **නීතිය** - **දඬුවම්** වැනි තත්ත්වයන් යටතේ ඇතිවන බිය මත නිර්මාණය වන අවනතභාවයක් ලෙස හඳුනා ගත හැකිවේ. රාජ්‍යය යාන්ත්‍රණය තුළ පවත්වනා අධිකරණ- බන්ධනාගාර - එල්ලුම් ගස් - ගිලටීන - කස පහර - පොලීසිය - හමුදාව වැනි මෙකී තත්ත්වයන් මත පුරවැසියා රාජ්‍යයට අවනත වේ.

නමුත් ජාතියට ඇති අවනතභාවය රාජ්‍යය පිළිබඳ පුද්ගලයාට ඇති අවනතභාවයට වඩා වෙනස් හැඩතල දරයි. එය බොහෝ විට ස්වේච්ඡාවෙන් නිර්මාණය කර ගන්නා අවනතභාවයකි. ඒ තුළ **ශ්‍රද්ධත්වය** - **පූජනීයත්වය** වැනි වන්දනීය තත්ත්වයන් පැවතිය හැකිය.

එමෙන්ම රාජ්‍යය තුළ දේශපාලනික පසුබිමක් (යාන්ත්‍රනයක්) පවතිද්දී ජාතිය තුළ පවතින්නේ සංස්කෘතික පසුබිමකි (යාන්ත්‍රණයකි.) ජාතිය තුළ ඇඳුම් පැලඳුම් ඇදහිලි- විශ්වාස - උත්සව - කලා ශිල්ප ආදී වූ සෘජු සංස්කෘතික ලක්ෂණ නිරූපනය වෙද්දී රාජ්‍යය තුළ නිරූපනය වන්නේ දේශපාලනික යාන්ත්‍රනයක් වේ. එනම් රාජ්‍යයේ ක්‍රියාකාරී අංශය වන ආණ්ඩුව පිළිබඳ අවධානය යොමු කිරීමේදී ව්‍යවස්ථාදායක- විධායක- අධිකරණ- ආදී ත්‍රිවිධ අංගයන් කරා බෙදෙන ආණ්ඩුව සහ ඒ හා බැඳුණු ගැඹුරු ක්‍රියාවලිය රාජ්‍යයේ ප්‍රායෝගික දේශපාලන හැඩය ප්‍රදර්ශනය කරයි.

- **දේශපාලන න්‍යායන් තුළ රාජ්‍ය හා ජාතිය සම්බන්ධ විග්‍රහයන්**

ෆැසිස්ට් වාදය

"ශ්‍රේෂ්ඨ ජාතිය ශ්‍රේෂ්ඨ රාජ්‍ය ෆැසිස්ට් වාදයේ අවසාන අරමුණ වේ"

ලිබරල් වාදය

"රාජ්‍ය යනු ජාතීන්ගේ සුභසාධනය සඳහා ක්‍රියාත්මක වන්නකි"

මාක්ස් වාදීන්

"විද්‍යාත්මක කොමියුනිස්ට් සමාජයක් තුළ රාජ්‍ය හා ජාතිය වියැකී යන බව සහ වියැකී යායුතු සංකල්පයන් ලෙස ප්‍රකාශ කිරීම"

මේ අනුව ෆැසිස්ට් වාදීන් සහ ලිබරල් වාදීන් පොදුවේ ජාතියේ සහ රාජ්‍යයේ වැදගත් කම අවධාරණය කරද්දී ඊට එරෙහි මතයක් ඉදිරිපත් කරන මාක්ස් වාදීන් අදහස් කරන්නේ රාජ්‍ය හා ජාතීය වියැකී යන බවයි.

**රචනා ප්‍රශ්න**

## 01. 1993 - 01

04. ජාතිය රාජ්‍යයෙන් වෙනස්වන්නේ කෙසේද?

**බහුවරණ ප්‍රශ්න**

## 01. 2005 - 10

"ජාතිය" යන්නට අදාළ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

A - එක් ජන වර්ගයකට හෝ ජනවර්ග කිහිපයකට හෝ අයත් පුද්ගල සමූහයක්.
B - දේශපාලන වශයෙන් එක් රාජ්‍යයක් තුළ සංවිධානය වී සිටීම.
C - පොදු දේශපාලන අභිමතාර්ථ හා ආශාවන් බෙදා හදා ගැනීම.
D - රාජ්‍යයන් කිහිපයක ජීවත්විය හැකිවීම.

1. ABC 2. BCD 3. ACD 4. ABD

# රාජ්‍යය හා සමාජය

# රා ජ්‍යය හා සමාජය

හැඳින්වීම

රාජ්‍යය යනු ,

- නිශ්චිත භූමිය, ජන සංඛ්‍යාව , ආණ්ඩුව හා ස්වාධිපත්‍ය බලය යන අංග ලක්ෂණ වලින් සමන්විත වූවකි.

- රාජ්‍යය දේශපාලන සංකල්පයකි.

දාර්ශනික නිර්වචන

**යම් නිශ්චිත භූමි ප්‍රදේශයක් ස්ථාවර වාස භූමි කරගත් සංඛ්‍යාත්මක වශයෙන් අඩු හෝ වැඩි යම් ජනසංඛ්‍යාවකින් සමන්විත, ජනතාවගේ බහුතර අනුමැතිය ලබන්නා වූ සංවිධානාත්මක ආණ්ඩුවක් සහිත, භාහිර වශයෙන් ස්වාධීන නැතිනම් වෙනත් පාලනයකට යටත් නොවූ මිනිස් සමාජය රාජ්‍යය වේ.**

-මහාචාර්ය ගානර්-

**සමාජය යනු කුමක්දැයි හඳුනාගැනීම.**

- කිසියම් සබඳතාවයකින් යුක්ත මිනිස් එකතුවක් සමාජය වේ.

  ආගම - කුලය - ජාතිය - වාර්ගිකත්වය - දේශපාලනය - ආර්ථිකය - ආරක්ෂාව වැනි සාධකයන්හි සබඳතාවයන් මත මානවයන් රාශිගත වේ.

- කුඩාම සමාජ ඒකකය පවුල (Family) වන අතර එය ජාත්‍යන්තර සමාජය (International Society) දක්වා අසීමිතව ව්‍යාප්තව පවතී.

- මහාචාර්ය එම්. ඕ. ඒ. ද සොයිසාට අනුව ,

  **"යම්නිශ්චිත භූමි ප්‍රදේශයක් තුළ ස්ථාවර වශයෙන් වාසය කරන එක් වාර්ගික ජන කොටසක් හෝ වාර්ගික ජන කොටස් කිහිපයක් විසින් තම ආශාවන් - අවශ්‍යතාවයන් සහ උවමනාවන් සංතෘප්ත කර ගැනීම සඳහා පිහිටුවාගෙන ඇති ආයතන - සමිති සමාගම් සහ සංවිධාන ජාලාවේ සමස්ත එකතුව සමාජය නම් වේ."**

දාර්ශනික නිර්වචන

**"සිය අන්‍යොන්‍ය අවශ්‍යතාවයන් සතුටින් සපුරා ගනිමින් එකට ජීවත් වන මිනිස් සමූහය සමාජය නම් වේ"**

-මහාචාර්ය ලැස්කි-

■ **ඉතිහාසය තුළ රාජ්‍ය හා සමාජය අතර වෙනසක් හඳුනාගැනීමට නොහැකි විය.**

ඓතිහාසිකව රාජ්‍යය හා සමාජය තුළ පැහැදිලි වෙනසක් හඳුනාගැනීමට සමකාලීනව විසූ දාර්ශනිකයන්ට නොහැකි විය.

**නිදර්ශන ලෙස,**

01. ප්ලේටෝ සහ ඇරිස්ටෝටල් වැනි ග්‍රීක දාර්ශනිකයන් රාජ්‍ය හා සමාජය සර්ව සම ලෙස විග්‍රහ කර ඇත.

**"රාජ්‍යයට යහපත් දේ සමස්ථ සමාජයටම යහපත් වේ''**
**-ප්ලේටෝ-**

ග්‍රීක පෞර රාජ්‍යය තුළ රාජ්‍ය විසින් සමාජයේ සෑම අංශයක්ම නියෝජනය කිරිම නිසා මෙසේ රාජ්‍ය හා සමාජය අතර වෙනසක් හඳුනා ගැනීමට නොහැකි විය.

02. ජර්මන් ජාතික විලියම් හෙගල් ද රාජ්‍යය හා සමාජය සර්ව සම ලෙස අර්ථකතනය කළේය. මොහු තව දුරටත් ප්‍රකාශ කරනු ලබන්නේ රාජ්‍ය ජනතාවගේ සාමුහික අවශ්‍යතාවයන් නියෝජනය කරන බවයි.

**"රාජ්‍යයේ කැමැත්ත සමාජයේ කැමැත්ත වේ"**
**-විලියම් හෙගල්-**

■ **රාජ්‍යය සහ සමාජය අතර වෙනස ප්‍රථමයෙන් හඳුනා ගැනීම**

තෝමස් හොබ්ස් විසින් සමාජ සම්මුතිවාදී විග්‍රහය මත පදනම් වී රාජ්‍ය සහ සමාජය අතර වෙනස ප්‍රථම වරට පැහැදිලි කළේය.

**"සමාජයේ කැමැත්ත තුළින් රාජ්‍යය බිහිවිය."**
**-තොමස් හොබ්ස්-**

බටහිර දාර්ශනිකයින් විසින් රාජ්‍යය හා සමාජය අතර ඇති වෙනස තව දුරටත් **ප්‍රොතෙස්තන්ත්‍ර** ව්‍යාපාරය (Protestant Movement) න් පසු අවධිය තුල විග්‍රහ කරන ලදී. ඒ රාජ්‍ය හා රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් ලෞකික පදනමක් ගවේෂණ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙනි.

■ **රාජ්‍ය හා සමාජය අතර ඇති වෙනස ආංශිකව පැහැදිලි කිරීම.**

● **ප්‍රභවය (පැරණි භාවය - උපත)**

ප්‍රභවය යන සාධක මත පිහිටා ගවේෂණය කරන කල්හි රාජ්‍යය හා සමාජය අතර වෙනස හඳුනාගත හැකිය. එනම් රාජ්‍යයට පූර්වයේ සමාජය පැවැති බවයි. එසේ නම් රාජ්‍යයට වඩා සමාජය පැරණිය.

නිදර්ශන,

01. <u>සමාජ විද්‍යාඥායින්ට අනුව</u> , රාජ්‍යය බිහිවීමට පෙර ප්‍රාථමික සමාජයන්හි පවුල, ආගම, විවාහය වැනි සමාජ සංස්ථා පැවැති බව ප්‍රකාශ කරයි.

02. <u>මාක්ස් වාදී න්‍යාය අනුව,</u> ඓතිහාසික භෞතිකවාදී විග්‍රහය මත පදනම් වූ මාක්ස් වාදය මුල්ම සමාජය ලෙස ප්‍රාග් කොමිනිස්ට් සමාජය දක්වන අතර එම සමාජය තුළ රාජ්‍ය නොවීය. මීළඟ සමාජය වන වහල් සමාජය තුළදී රාජ්‍යය බිහි වේ. එසේ නම් පැහැදිලි වන්නේ රාජ්‍යයට පෙර සමාජය ප්‍රභවය ලබා තිබූ බවයි.

03. <u>සමාජ සම්මුතිවාදින්ට අනුව,</u> සමාජ සම්මුතියක (එකගතාවය) ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය බිහි විය. සමාජ සම්මුතියක ප්‍රතිඵලයක් තුළින් රාජ්‍ය බිහිවූයේ නම් රාජ්‍යයට පෙර සමාජය බිහි වූ බව පැහැදිලි වේ.

04. <u>සමාජ විකාශන වාදයට අනුව,</u> සමාජ විකාශනයක් මගින් රාජ්‍යය නිර්මාණය විය. එසේ නම් රාජ්‍යයට පෙර සමාජය පැවැති බව පැහැදිලි වේ.

ඉහත නිදර්ශන මගින් පැහැදිලි වන්නේ පැරණි භාවය මත (ප්‍රභවය මත) රාජ්‍ය හා සමාජය අතර වෙනසක් පවතින බවයි.

- <u>බලය</u>

බලය යන සාධකයට අනුවද රාජ්‍යය හා සමාජය අතර වෙනසක් පවතින බව පෙන්වා දිය හැකිය. බලය යන කරුණ තව දුරටත් ආංශිකව විග්‍රහ කළ හැකිය.

බලය නාමකරණය මත
බලයේ ප්‍රමාණය මත
බලය ක්‍රියාවට නගන උපකරණ මත

<u>බලය නාමකරණය මත</u>

රාජ්‍යයේ බලය හැඳින්වීම සඳහා ආවේණික නාමකරණයන් සමූහයක් ඇත. ස්වාධිපත්‍ය බලය, පරම බලය, අසහාය බලය, උත්තරීතර බලය ලෙසින් දැක්විය හැකි අතර සමාජ බලය හැඳින්වීම සඳහා එසේ ආවේණික වූ නාමකරණයන් නොමැත.

බලය ප්‍රමාණය මත

රාජ්‍යයේ බලය සහ සමාජයට හිමි බලය අතර බලයේ ප්‍රමාණය මත වෙනසක් ඇත. රාජ්‍යයට මුළු සමාජයටම බලපාන ආකාරයට ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ කටයුතු කරමින් පුද්ගලයන් හා පුද්ගල කණ්ඩායම් පාලනයට අවනත කරවා ගැනීමට බලය ඇත. එය තහවුරු කිරීමට අපූරු සාහිත්‍යමය ප්‍රකාශනයක් උපුටා දැක්විය හැකිය. **මෑණියන්ට සිය දරුවා ඝාතනය කිරීමට නොහැකි මුත් රාජ්‍යයට එය කල හැක්කේ රාජ්‍ය සතුබලය නිසාය.** නමුත් සමාජයට මෙවැනි සුවිශාල බලයක් හිමි නොවේ. රාජ්‍යය බලයට යටත්ව පැවතීමට සමාජයට සිදු වේ.

බලය ක්‍රියාවට නගන උපකරණ මත

බලය ක්‍රියාවට නගන උපකරණ මත රාජ්‍යය හා සමාජය අතර වෙනසක් දැකිය හැකිය. රාජ්‍යයේ බලය ක්‍රියාවට නැගිම සඳහා ආණ්ඩුව , පොලිසිය, හමුදාව , බන්ධනාගාර, හිරගෙවල් පවතින අතර සමාජීය බලය ක්‍රියාවට නැගිම සඳහා එවැනි විශේෂ උපකරණ නොමැත.

- දඬුවම්

දඬුවම් යන සාධකය මත රාජ්‍ය හා සමාජය අතර වෙනසක් හඳුනා ගත හැකිය. රාජ්‍යය පාලන කටයුතු සිදු කරන්නේ නීති පදනම් කර ගෙනය. එම නීති කඩකරන ඕනෑම පුද්ගලයෙකුට හෝ පුද්ගල කාණ්ඩායමකට රාජ්‍යය දඬුවම් ලබා දේ. දඩගැසීම, නඩු පැවරීම, සිරගත කිරීම, මරණ දණ්ඩනය වැනි දඬුවම් රාජ්‍යය විසින් ලබා දේ. පුද්ගලයාගේ ජීවිතයත් මරණයත් අතර ඕනෑම දඬුවමක් ලබා දීමට රාජ්‍යයට හැකිය. නමුත් සමාජයට එසේ දඬුවම් දීමේ හැකියාවක් නොමැත. සමාජයට ලබා දිය හැකි දඬුවම් වන්නේ සමාජයෙන් කොන් කිරීම, නොසලකා හැරීම, නම්පට බැඳීම, උපහාසයට ලක් කිරීම , අවතක්සේරුවට ලක් කිරීමයි. මෙලෙස දඬුවම් යන කරුණ මත රාජ්‍යය හා සමාජය අතර වෙනසක් පවති.

නිදර්ශන,

එකම වරදට රාජ්‍ය හා සමාජය ලබාදෙන දඬුවම දෙආකාරය. මිනිස් ඝාතකයෙකු ගත් කල්හි රාජ්‍ය විසින් ඔහුට මරණ දණ්ඩනය ලබා දෙයි. නමුත් සමාජය විසින් දෙනු ලබන දඬුවම වන්නේ කොන් කිරීම, ප්‍රතික්ෂේප කිරීම වැනි දණ්ඩනයන් ය.

- ව්‍යාප්තිය

ව්‍යාප්තිය සම්බන්ධයෙන්ද රාජ්‍ය හා සමාජය අතර වෙනසක් හඳුනා ගත හැකිය. එනම් රාජ්‍යයේ ව්‍යාප්තික සිමාව සම්බන්ධයෙන් සීමාවක් ඇති මුත් සමාජයේ ව්‍යාප්තික සිමාව සම්බන්ධයෙන් සිමාවක් නැත. රාජ්‍යයේ ව්‍යාප්තික සිමාව එම රාජ්‍යයට අයත් භූමියට සිමා වන අතර පවුල නැමැති ප්‍රාථමික ඒකකයෙන් ඇරඹි සමාජය ලෝක සමාජය දක්වා අසීමිතව ව්‍යාප්තව පවතියි.

- <u>නිර්මාණය වී ඇති ආකාරය</u>

රාජ්‍ය සහ සමාජය අතර නිර්මාණය වී ඇති ආකාරය මත වෙනසක් පවතී.

සමාජය ⟶ ස්වාභාවික නිර්මාණයකි.

රාජ්‍යය ⟶ කෘතිම නිර්මාණයකි.

සමාජය නිර්මාණය වීමට අදාල තත්ත්වය ස්වාභාවික මිනිස් හැසිරීමේ ප්‍රතිඵලයක් යැයි ප්‍රකාශ කල හැකිය. නමුත් රාජ්‍යය නිර්මාණය වීමට අදාල තත්ත්වයන් ද්විතීකව බිහි වූ බව පෙනේ. මිනිස් කැමැත්තේ සහ තාර්කික බුද්ධියේ ප්‍රතිඵලයක් ලෙසින් රාජ්‍යය කෘතිමව නිර්මාණය කරගන්නා ලදී.

- <u>නිරූපණය කරන අංශ</u>

නිරූපණය කරන අංශ සම්බන්ධයෙන්ද රාජ්‍යය හා සමාජය අතර වෙනසක් ඇත.

රාජ්‍යය ⟶ දේශපාලනික අංශ

සමාජය ⟶ සංස්කෘතික අංශ

<u>රාජ්‍යය විසින් දේශපාලන අංශ</u> වන ආණ්ඩුව , දේශපාලන පක්ෂ, බලපෑම් කණ්ඩායම්, මැතිවරණ, දේශපාලන ආයතන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා,වැනි අංශ නිරූපණය කරයි.

<u>සමාජය විසින් සංස්කෘතික අංශ</u> වන සිරිත් විරිත්, ඇඳුම් පැළඳුම්, ආහාර පාන, උත්සව වැනි අංශ නිරූපණය කරයි.

ඉහත ආකාරයට නිරූපනය කරනු ලබන අංශ යටතේද රාජ්‍ය හා සමාජය අතර වෙනසක් තිබේ.

- <u>නියෝජනය කරන අංශ</u>

නියෝජනය කරනු ලබන අංශ සම්බන්ධයෙන්ද රාජ්‍ය හා සමාජය අතර වෙනසක් ඇත. <u>සමාජය විසින් ඉතා සංකීර්ණ අංශයන් වන ආදරය, කරුණාව, මිත්‍රත්වය වැනි අංශයන් නියෝජනය කරනු ලබයි. නමුත් රාජ්‍යයට එවැනි සංකීර්ණ අංශයන් සෘජුවම නියෝජනය කළ නොහැක.</u> ඒවාට වක්‍රාරයෙන් බලපෑම් කිරීමට පමණක් රාජ්‍යයට හැකිය.

නිදර්ශන - විවාහය වැනි සංකීර්ණ මානව සම්බන්ධතාවයන්ට රාජ්‍යයට සෘජුවම මැදිහත් විය නොහැකි අතර එයට වක්‍රාරයෙන් සම්බන්ධ වේ.

- <u>පාලනය කරනු ලබන අංශ</u>

පාලනය කරනු ලබන අංශ සම්බන්ධයෙන්ද රාජ්‍යය හා සමාජය අතර වෙනසක් හඳුනා ගත හැකිය. <u>රාජ්‍යය විසින් පුද්ගලයාගේ බාහිර ජීවිතය පාලනය කරනු ලබන අතර සමාජය විසින් සමාජ ධර්මතා මත පුද්ගලයන්ගේ අභ්‍යන්තරය පාලනය කරනු ලබයි.</u>

නිදර්ශන,

රාජ්‍යය මගින් මිනිසුන්ගේ බාහිර තත්ත්වයන් පාලනය කරනු ලබන්නේ <u>නීති මගිනි.</u> මිනිස් අයිතිවාසිකම් , යුතුකම් , දඬුවම් වැනි සාධක හරහා එය සිදු කරනු ලබයි. සමාජය මගින් මානවයා පාලනය කරනු ලබන්නේ <u>සමාජ ධර්මතා</u> මගිනි. සාරධර්ම , සිරිත් විරිත් , හොඳනරක සම්ප්‍රදායන් වැනි සාධක දැක්විය හැකිය.

**රචනා ප්‍රශ්න**

**01. 1983 - 01**

රාජ්‍යය හා සමාජය අතර ඇති වෙනස්කම් සාකච්ඡා කරන්න.

**බහුවරණ ප්‍රශ්න**

**01. 1999 - 07**

සමාජය හැඳින්වීමේදී සාවද්‍ය වන ප්‍රකාශය නම් කරන්න.

1. තමන්ට විශේෂ වූ සංස්කෘතියනට පොදුවේ උරුමකම් කියන මනුෂ්‍ය කණ්ඩායමක්
2. එය රාජ්‍යයට පොරොත්තුව ඇති වූවකි.
3. එය කෘත්‍රිම නිර්මාණයකි.
4. එහි සාමාජිකත්වය ප්‍රධාන වශයෙන් ජෛව විද්‍යාත්මකව ඇතිවෙයි.

**02. 2001 - 07**

සමාජය ගැන අදාළ නොව ප්‍රකාශය තෝරන්න.

1. රාජ්‍යයට ප්‍රථමයෙන් සමාජය බිහිවිය.
2. සමාජයට ස්වාධිපත්‍ය බලය හිමිවේ.
3. රාජ්‍යයට වඩා සමාජය පුළුල් වූවක් වේ.
4. මිනිසුන්ගේ සමාජ හැසිරීම කෙරෙහි සමාජය බලපෑම් කරනු ලබයි.

**03. 2004 - 07**

සමාජය කෙරෙහි අදාළ නොවන ප්‍රකාශය තෝරන්න.

1. සමාජය ස්වාභාවික දෙයකි.
2. සමාජයට භෞමික සීමාවන් නොමැත.
3. සමාජය සමන්විත වන්නේ මිනිසුන් විසින් ගොඩනගා ඇති සියළු සමාජ සංවිධානයන් ගෙනි.
4. සමාජය ගොඩනැගී ඇත්තේ එහි සමාජිකයන්ගේ අනිවාර්යය සහයෝගය මතය.

**04. 2005 - 08**

රාජ්‍යය සහ සමාජය අතර වෙනස දැක්වෙන නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

A - රාජ්‍යය මගින් දේශපාලන ක්‍රමය ද සමාජය මගින් සමාජ ක්‍රමය ද නිරූපණය කරනු ලැබේ.
B - රාජ්‍යයට ස්වාධිපත්‍ය බලය හිමි වුව ද සමාජයට නොමැත.
C - සමාජය රාජ්‍යයට වඩා පුළුල් දෙයක් වේ.
D - රාජ්‍යය සමාජයට ප්‍රථමයෙන් බිහි වී ඇත.

1. ABC 2. BCD 3. ACD 4. ABD

- **ප්‍රශ්නයේ මාතෘකාවට නොගැලපෙන ප්‍රකාශය තෝරන්න**

**05. 2007 - 07**

සමාජය,

1. නිශ්චිත දේශ සීමාවන් සහිත භූමියක වාසය කරන මිනිසුන්ගේ එකතුවකි.
2. සමූහගත වී ජීවත් වීමට මිනිසුන් තුළ ඇති කැමැත්තේ ප්‍රතිඵලයකි.
3. සියලු දෙනාගේම පොදු ආශාවන් පිළිබිඹු කරයි.
4. රාජ්‍යයට වඩා උසස් වේ.

**06. 2008 - 10**

සමාජය ,

1. රංචු ගැසීමට මිනිසා තුළ පවතින සහජ කැමැත්තේ ප්‍රතිඵලයක් වේ.
2. දේශසීමාවන් සහිත වූවකි.
3. සංවිධානය වූ මෙන්ම සංවිධාන නොවූ සියලුම සමාජ සංවිධාන අන්තර්ගත කර ගනියි
4. රාජ්‍යයට ප්‍රථමයෙන් බිහිවූවක් වේ.

- **අදාළ ප්‍රකාශ ඇතුළත් ප්‍රකාශ කාණ්ඩය දක්වන්න.**

**07. 2011 - 11 (පැරණි)**

සමාජය ,

A - සම්බන්ධතා ජාලයකි. B - රාජ්‍යයට ද්විතීය වෙයි.
C - මානවයින්ගේ සාමාජයීය සම්බන්ධතා උදෙසා ප්‍රමිති පිළියෙල කරයි.
D - යහපත් ජීවිතයක් සඳහා අත්‍යවශ්‍ය කොන්දේසියකි.

1. ABC 2. BCD 3. ACD 4. ABD

## කෙටි ප්‍රශ්න

**01. 2011 - 03 (නව)**

රාජ්‍යය, සමාජයෙන් වෙනස් වන සාධක දෙකක් සඳහන් කරන්න.

.....................................................................................................
.....................................................................................................

# රාජ්‍යය හා ආණ්ඩුව

# රාජ්‍යය හා ආණ්ඩුව

හැඳින්වීම

රාජ්‍යය යනු

- නිශ්චිත භූමිය, ජන සංඛ්‍යාව , ආණ්ඩුව හා ස්වාධිපත්‍ය බලය යන අංග ලක්ෂණ වලින් සමන්විත වූවකි.
- රාජ්‍යය දේශපාලන සංකල්පයකි.

<u>දාර්ශනික නිර්වචන</u>

**යම් නිශ්චිත භූමි ප්‍රදේශයක් ස්ථාවර වාස භූමි කරගත් සංඛ්‍යාත්මක වශයෙන් අඩු හෝ වැඩි යම් ජනසංඛ්‍යාවකින් සමන්විත, ජනතාවගේ බහුතර අනුමැතිය ලබන්නා වූද සංවිධානාත්මක ආණ්ඩුවක් සහිත, භාහිර වශයෙන් ස්වාධීන නැතිනම් වෙනත් පාලනයකට යටත් නොවූ මිනිස් සමාජය රාජ්‍යය වේ.**

-මහාචාර්ය ගානර්-

**ආණ්ඩුව යනු කුමක්දැයි හඳුනාගැනීම.**

- රාජ්‍යයට අයත් අංග ලක්ෂණ හතරෙන් එක් ලක්ෂණයකි.
- ආණ්ඩුව හැඳින්වීමට භාවිතා වන විවිධ දේශපාලන විචරණයන්

  රාජ්‍යයේ ක්‍රියාකාරි අංශය , රාජ්‍යයේ සංවිධානාත්මක අංශය, රාජ්‍යයේ ප්‍රායෝගික හස්තය - රාජ්‍යයේ ක්‍රියාකාරි මෙවලම - රාජ්‍යය තුළ නීතිය හා සාමය ආරක්ෂා කරමින් ජනතාව පොදු අරමුණු කරා මෙහෙයවන්නා - රාජ්‍යයේ අභිමතය ප්‍රකාශ කිරීමේත් මෙහෙයවීමෙත් මාධ්‍යය.

- ආණ්ඩුවේ ව්‍යුහය කොටස් තුනකින් සමන්විත වේ.

  ව්‍යවස්ථාදායකය - විධායකය - අධිකරණය

- ප්‍රායෝගික තත්ත්වය තුළ ආණ්ඩුව ලෙස හඳුනා ගන්නේ විධායකය පමණි.

<u>දාර්ශනික නිර්වචන</u>

**"රාජ්‍යය හෝ මහජනතාවගේ කැමැත්ත ප්‍රතිපත්ති වලට හැරවීමත් ක්‍රියාවට නැගීමත් කරනු ලබන නියෝජිතයා ආණ්ඩුව වේ"**

-මහාචාර්ය ගානර්-

## ■ රාජ්‍යය සහ ආණ්ඩුව සර්වසම ලෙස සැලකූ බව ඉතිහාසය තුළින් හඳුනා ගත හැකිය.

රාජ්‍යය සහ ආණ්ඩුව අතර ඇති සමීපතම සම්බන්ධය නිසා මෙම සංකල්ප දෙක සර්වසම ලෙස සලකා තිබුණි. ඇතැම් දේශපාලන දාර්ශනිකයන් මෙන්ම ඒකාධිපති පාලකයන් ද රාජ්‍යය හා ආණ්ඩුව සර්වසම ලෙස සලකා තිබේ.

නිදර්ශන

01. දේශපාලන දාර්ශනිකයකු වූ (තෝමස් හොබ්ස්)
**"ආණ්ඩුව විසුරුවා හැරිය විට රාජ්‍යයද විසිර යයි"**

02. ඒකාධිපති පාලකයෙකු වූ (XIV වන ලුවී රජු)
**"රාජ්‍යය යනු මමයි. මම යනු රාජ්‍යයයි"**

නූතනයේ ජනප්‍රිය තලයේ දේශපාලන සංවාද තුළ රජය, රාජ්‍යය, ආණ්ඩුව යන පද අර්ථ බේදයකින් තොරව භාවිතා වීම තුළින්ද පැහැදිලි වන්නේ රාජ්‍ය හා ආණ්ඩුව අතර වෙනසක් නොමැති බවයි.

## ■ රාජ්‍යය හා ආණ්ඩුව අතර ඇති වෙනස ආංශිකව හඳුනා ගැනීම.

### ● සාමාජිකත්වය

සාමාජිකත්වය යන සාධක මත රාජ්‍යය හා ආණ්ඩුව අතර වෙනස හඳුනා ගත හැකිය. සාමාජිකත්වය යන සාධකයද තවදුරටත් විග්‍රහ කල හැකිය.

සාමාජිකත්වයේ අනිවාර්යභාවය මත.

සාමාජිකත්වයේ ප්‍රමාණය මත.

සාමාජිකත්වයට හිමිව ඇති නාමකරණය මත.

සාමාජිකත්වයෙන් සංකේතවත් වන දෙය මත.

සාමාජිකත්වයේ අනිවාර්යභාවය මත

සෑම පුද්ගලයෙකුම රාජ්‍යයක සාමාජිකයෙකු වන මුත් ආණ්ඩුවේ සමාජිකයෙකු නොවේ. ජීවත්වන සෑම පුද්ගලයෙක්ම රාජ්‍යයක සාමාජිකයෙකු විය යුතුමය එනම්, රාජ්‍යයේ සාමාජිකත්වය පුද්ගලයාට අනිවාර්ය වේ. ග්‍රීක මහාදාර්ශනික ඇරිස්ටෝටල්ට අනුව,

**"රාජ්‍යයක සාමාජිකත්වය නොලබා සිටිය හැක්කේ දෙවියන්ට සහ තිරිසන් සතුන්ට පමණි. නොඑසේ නම් නුපන් අයට සහ මියගිය අයට පමණ"**

මින් පැහැදිලි වන්නේ රාජ්‍යයේ සාමාජිකත්වය අනිවාර්ය බවයි. නමුත් ආණ්ඩුවේ සාමාජිකත්වය සම්බන්ධයෙන් පුද්ගලයාට අනිවාර්ය භාවයක් නොමැත.

සාමාජිකත්වයේ ප්‍රමාණය මත

රාජ්‍යයක සාමාජිකත්වයේ ප්‍රමාණය විශාල මුත් ආණ්ඩුවේ සාමාජිකත්වයේ ප්‍රමාණය කුඩාය. රාජ්‍යයේ සාමාජිකත්වය ආණ්ඩුවේ සාමාජිකත්වයට සාපේක්ෂව ඉතා විශාලය.

**නිදර්ශන** - චීනයේ ජනගහනය කෝටි 130 ආසන්නවේ.

නමුත් ආණ්ඩුවේ සාමාජිකත්වයේ ප්‍රමාණය කුඩාවේ. ආණ්ඩුවේ සාමාජිකයන් ලෙස ව්‍යවස්ථාධායක , විධායක, අධිකරණ යන ත්‍රිවිධ ආයතන වල වගකීම් පැවරි ඇති පිරිස ලෙස පෙන්වා දිය හැකිය. එහි ප්‍රමාණය රාජ්‍යයේ සාමාජිකත්වයේ ප්‍රමාණයට සාපේක්ෂව කුඩා වේ.

සාමාජිකත්වයට හිමිව ඇති නාමකරණය මත

සමාජිකත්වයට හිමිව ඇති නාමකරණය මත රාජ්‍ය හා ආණ්ඩුව අතර වෙනසක් පවති. රාජ්‍යයේ සමාජිකයන් ''පාලිතයන්'' ලෙසත් ආණ්ඩුවේ සමාජිකයන් ''පාලකයන්'' ලෙසත් දේශපාලන විද්‍යාව තුළදී නාමකරණයට බඳුන් වේ.

සාමාජිකත්වයෙන් සංකේතවත් වන දෙය මත

රාජ්‍යයේ සමාජිකත්වයට සමස්ථ පුරවැසියන් අයත් වන බැවින් එමගින් ''ජාතිය'' (Nation) සංකේතවත් කෙරේ. නමුත් ආණ්ඩුවේ සාමාජිකත්වයෙන් එසේ පැහැදිලිව සංකේතවත් වන දෙයක් හඳුනා ගත නොහැකිය.

- බලය

බලය යන ලක්ෂණය මත රාජ්‍ය හා ආණ්ඩුව අතර වෙනස හඳුනා ගත හැකිය. රාජ්‍යයට ස්වාධිපත්‍ය බලය හිමිව ඇතත් ආණ්ඩුවට එවැනි බලයක් හිමිව නොමැත. රාජ්‍යය අචේතනික , ප්‍රායෝගික ක්‍රියාකාරීත්වයක් නොමැති සංකල්පයක් බැවින් තම බලය ක්‍රියාවට නැංවීමට නොහැකිය. එම නිසා රාජ්‍යයට හිමි බලය ක්‍රියාවට නැංවීමේ උපකරණය බවට පත්ව ඇත්තේ ආණ්ඩුවයි. එම නිසා **"රාජ්‍යය ස්වාමියා ලෙසත් ආණ්ඩුව සේවකයා ලෙසත් හඳුන්වයි"** මුලු රාජ්‍යයට බලපාන ආකාරයට ව්‍යවස්ථාධායක , විධායක, අධිකරණ යන ත්‍රිවිධ ආයතනයන්හි කටයුතු කිරීමට අවශ්‍ය බලය ආණ්ඩුවට හිමිකර දෙනු ලබන්නේ රාජ්‍ය විසිනි. මේ ආකාරයට බලය යන සාධකය මත රාජ්‍යය හා ආණ්ඩුව අතර වෙනස හඳුනා ගත හැකිය.

- **ස්ථාවරභාවය**

ස්ථාවරභාවය මත රාජ්‍ය හා ආණ්ඩුව අතර වෙනස හඳුනා ගත හැකිය. රාජ්‍යය ස්ථාවර ආයතනයක් වන අතර ආණ්ඩුව ස්ථාවර ආයතනයක් නොවේ. නිශ්චිත භූමිය, ජනසංඛ්‍යාව, ස්වාධිපත්‍ය බලය, ආණ්ඩුව යන අංග ලක්ෂණ පවතින තාක්කල් රාජ්‍ය නැමැති ආයතනය ස්ථාවරව පවතියි. නමුත් ආණ්ඩුව අස්ථාවර ආයතනයකි. එය නිශ්චිත කාල සීමාවකට පමණක් (නිල කාලයකට) සීමා වූ ආයතනයකි.

**නිදර්ශන :** ආණ්ඩුවක් සමාන්‍යයෙන් වසර 5-6 ආදි කෙටි නිල කාලයක් තුළ විසිර යයි.

මෙය සාමාන්‍ය තත්ත්වයක් තුළ ආණ්ඩුව අස්ථාවර වන බවට නිදර්ශනයකි. නමුත් විශේෂිත තත්ත්වයක් යටතේ ආණ්ඩුව ඊට පෙර වුව ද අස්ථාවර විය හැකිය.

**නිදර්ශන :**
- ★ විප්ලව මගින් හෝ කැරැල්ලක් මගින් ආණ්ඩුව පෙරළා දැමීම.
- ★ පාලකයා ඉල්ලා අස්වීම.
- ★ පාලකයා මිය යාම.
- ★ දෝශාභියෝග චෝදනා මත පාලකයා ඉවත් වීම.
- ★ විශ්වාසභංග යෝජනා මත පාලකයා ඉවත් වීම.

- **අවනතභාවය**

අවනතභාවය මත රාජ්‍ය හා ආණ්ඩුව අතර වෙනස හඳුනා ගත හැකිය. න්‍යායික විග්‍රහයට අනුව රාජ්‍යයට පුද්ගලයා අවනත විය යුතු අතර ආණ්ඩුවට අවනත වීමට පුද්ගලයා බැඳී නැත. රාජ්‍යයට පුද්ගලයා අවනත විය යුතු හේතු කිහිපයකි. **ඒවා නම් ,**

තමා රාජ්‍යයේ නිත්‍ය සමාජිකයෙකු වීම.
පුද්ගල කැමැත්ත මත රාජ්‍ය නිර්මාණය කරගත් නිසාත්
රාජ්‍යට විරුද්ධ වීම රාජ්‍යය ද්‍රෝහියකු ලෙස චෝදනා ලැබීමට හේතුවීම.
රාජ්‍යයට විරුද්ධ වීම තමා තමාටම විරුද්ධ වීම හා සමාන නිසාත්

ඉහත කරුණු නිසා පුද්ගලයා රාජ්‍යයට අවනත විය යුතුය. නමුත් ආණ්ඩුවට අවනත වීමට පුද්ගලයා බැඳී නොමැත. **ඊට අදාළ හේතු ,**

තමා ආණ්ඩුවේ සාමාජිකයකු නොවීම.
ආණ්ඩුව ජනතාවගේ සුභ සිද්ධියට තාවකාලිකව නිර්මාණය කළ ආයතනයක්වීම.

වැනි හේතු නිසා ආණ්ඩුවට අවනත නොවී සිටීමට හැකිය. ආණ්ඩු විවේචනය හා ආණ්ඩු පෙරළීමට කටයුතු කිරීම ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් ක්‍රියාත්මක වන රටවල ජනතාව භුක්තිවිඳින අයිතිවාසිකමකි. නමුත් ප්‍රායෝගික තලයේදී පුද්ගලයාට රාජ්‍යයට මෙන්ම ආණ්ඩුවටද අවනත වීමට සිදු වේ. ඒ රාජ්‍යය වෙනුවෙන් පෙනී සිටින්නේ සහ රාජ්‍යයේ බලය ක්‍රියාවට නංවන්නා ආණ්ඩුව වන බැවිනි.

- <u>සමාන අසමානතාවය</u>

රාජ්‍ය සහ ආණ්ඩුව අතර සමාන අසමානතාවය මත ද වෙනස හඳුනා ගත හැකිය. <u>රාජ්‍යයන් සමරූපී වන අතර ආණ්ඩු සමරූපී නොවේ.</u> නිශ්චිත භූමිය , ජන සංඛ්‍යාව , ආණ්ඩුව, ස්වාධිපත්‍ය බලය යන ලක්ෂණ හතර මත රාජ්‍ය නිර්මාණය වන අතර ලොව කොතැනක පවතින රාජ්‍යයක් වුව ද එක හා සමාන වේ. භූමියේ, ජනගහණයේ ප්‍රමාණයන් පමණක් වෙනස්වේ. නමුත් ආණ්ඩුව රාජ්‍යයෙන් රාජ්‍යයට වෙනස් වේ.

**නිදර්ශන :**

| | | | |
|---|---|---|---|
| දේශපාලන න්‍යාය මත | ⟶ | ලිබරල් ආණ්ඩු ක්‍රම | (බ්‍රිතාන්‍යය) |
| | | සමාජ වාදී ආණ්ඩු ක්‍රම | (චීනය) |
| | | පැසිස්ට් වාදී ආණ්ඩු ක්‍රම | (ඉතාලිය) |
| බලය බෙදීම මත | ⟶ | ඒකීය ආණ්ඩු ක්‍රම | (බ්‍රිතාන්‍යය, ලංකාව) |
| | | සංධීය ආණ්ඩු ක්‍රම | (ඇමරිකාව,ඉන්දියාව) |
| විධායකයේ ස්වරූපය | ⟶ | ජනාධිපති ආණ්ඩු ක්‍රම | (ඇමරිකාව) |
| | | කැබිනට් ආණ්ඩු ක්‍රම | (බ්‍රිතාන්‍යය) |
| | | මිශ්‍ර ආණ්ඩු ක්‍රම | (ලංකාව) |
| | | ඒක තන්ත්‍ර | (නේපාලය, ඕමානය) |

ඉහත ආකාරයට සමාන අසමානතාවය මත රාජ්‍ය හා ආණ්ඩු අතර වෙනසක් පවතියි.

- <u>භූමිය</u>

භූමිය යන සාධකය මත රාජ්‍යය හා ආණ්ඩුව අතර වෙනසක් පවතී. <u>රාජ්‍යයක් නිර්මාණය වීම සඳහා භූමිය අනිවාර්යය මුත් ආණ්ඩුවක් පැවතීම සඳහා භූමිය යන සාධකය අනිවාර්ය නොවේ.</u>

**නිදර්ශන,**

01. දෙවන ලෝක යුධ සමයේ <u>ජර්මනිය</u> විසින් <u>නෝර්වේ</u> රාජ්‍ය ආක්‍රමණය කල අවස්ථාවේ නෝර්වේ ආණ්ඩුව එංගලන්තය තුළ පිහිටු වීම.

02. 1990 දී <u>ඉරාකය</u> විසින් <u>කුවේට්</u> රාජ්‍ය ආක්‍රමණය කළ විට කුවේට් ආණ්ඩුව සෞදි අරාබිය තුළ පිහිටු වීම.

ඉහත ආකාරයට රාජ්‍යයක් පැවතීමට නිශ්චිත භූමිය අනිවාර්ය මුත් ආණ්ඩුවක් පැවතීම සඳහා භූමිය අනිවාර්ය නොවේ.

● සංකල්පීය ආකෘතියකින් විග්‍රහ කිරීමේදී

රාජ්‍ය සහ ආණ්ඩුව සංකල්පයන් දෙකක් ලෙස ගෙන විග්‍රහ කිරීමේදී තවදුරටත් වෙනස්කම් හඳුනා ගත හැකිය. රාජ්‍ය අචේතනික සංකල්පයක් වන අතර ආණ්ඩුව සචේතනික සහ ප්‍රායෝගික ක්‍රියාකාරීත්වයක් සහිත සංකල්පයයක් වේ.

රාජ්‍ය අතිශයින් සංකීර්ණ සංකල්පයක් වේ. එනම් ඇසට නොපෙනෙන, ස්පර්ශ කල නොහැකි දුරවබෝධ සංකල්පයකි. නමුත් ආණ්ඩුව සංකීර්ණ සංකල්පයක් නොවේ. එය ඇසට පෙනෙන වෙනස්කම් වලට භාජනය වන සංකල්පයකි.

රාජ්‍ය පරිපූර්ණ සංකල්පයක් වේ. එනම් භූමිය , ජන සංඛ්‍යාව, ස්වාධිපත්‍ය, ආණ්ඩුව යන ලාක්ෂණිකයන් හතරේ නිමැවුමකි. නමුත් ආණ්ඩුව පරිපූර්න සංකල්පයක් නොවන අතර එය රාජ්‍යය යන සංකල්පයේ එක් අංශයක් පමණි. මෙම විග්‍රහය මත රජය හා ආණ්ඩුව අතර ඇති වෙනස්කම් සනාථ කළ හැකිය.

**රචනා ප්‍රශ්න**

**01. 2005 - 02**

1. රාජ්‍යය සහ ආණ්ඩුව අතර වෙනස පැහැදිලි කරන්න.

**02. 2006 - 04**

1. රාජ්‍යය සහ ආණ්ඩුව හා රාජ්‍යය සහ අනෙක් සමාජ සංවිධාන අතර වෙනස්කම් සාකච්ඡා කරන්න.

# රාජ්‍යය හා ස්වෙච්ඡා සමාගම්

# රාජ්‍යය හා ස්වේච්ඡා සමාගම්

**රාජ්‍යය යනු,**

- නිශ්චිත භූමිය, ජන සංඛ්‍යාව, ආණ්ඩුව, ස්වාධිපත්‍ය බලය යන ලාක්ෂණිකයන් ගෙන් සමන්විත වූවකි.
- දේශපාලන සංකල්පයකි.
- රාජ්‍යය මිනිසුන් එකට එකතු වී නිර්මාණය කරගත් සමාජ සංවිධානයක් වේ.
- පොදු අරමුණු වෙනුවෙන් දේශපාලනික වශයෙන් සංවිධානය වු සමාගම රාජ්‍යය ලෙස තව දුරටත් හැඳින්විය හැකිය.

දාර්ශනික නිර්වචන

**"ප්‍රීතිමත් හා ගෞරවාන්විත ජීවිතයක් ගත කිරීමේ අරමුණින් මිනිසුන් එකට එකතු වී පිහිටුවා ගත් සංවිධානය රාජ්‍යය වේ."**
-ඇරිස්ටෝටල්-

**අනෙකුත් සංවිධාන - ස්වේච්ඡා සමාගම් යනු ,**

- විශේෂ අරමුණක් හෝ අරමුණු කිහිපයක් වෙනුවෙන් සිය කැමැත්ත මත එකට එකතු වූ මිනිස් සමූහය ස්වේච්ඡා සමාගමක් ලෙස සරලව නිර්වචනය කල හැකිය.

- ස්වේච්ඡා සමාගම් වල දිස්වන ඉතා ප්‍රකට ලක්ෂණයක් වන්නේ ඒවා විවිධ ස්වරූප ගැනීම සහ ඒවායේ අරමුණු විවිධත්වයක් පැවතීමයි.

**නිදර්ශන :**
ඇතැම් සමාගම් ආර්ථික අරමුණු ඉටු කර ගැනීමට තැත් කරයි.
ඇතැම් සමාගම් දේශපාලන අරමුණු ඉටු කර ගැනීමට තැත් කරයි.
ඇතැම් සමාගම් සමාජීයීය අරමුණු ඉටු කර ගැනීමට තැත් කරයි.
ඇතැම් සමාගම් සංස්කෘතික අරමුණු ඉටු කර ගැනීමට තැත් කරයි.
ඇතැම් සමාගම් ආගමික අරමුණු ඉටු කර ගැනීමට තැත් කරයි.

- සමාජය තුල හඳුනා ගත හැකි ස්වේච්ඡා සමාගම් වලට නිදර්ශන

| | |
|---|---|
| ක්‍රීඩා සමිති | මහිලා සමිති |
| යෞවන සමාජ | ග්‍රාමෝදය සමිති |
| මරණාධාර සමිති | සර්වෝදය |

ඉහත ආකාරයට රාජ්‍යය නැමැති සමාජ සංවිධානය හා අනෙකුත් සංවිධාන හැඳින්විය හැකිය. මෙහිදී අවධාරණයෙන් මතක තබා ගත යුත්තේ අවසානිකව සියලුම සංවිධාන රාජ්‍යයේ අධිකාරියට යටත් බව හා රාජ්‍යය සියලු සංවිධාන වල පොදු සංවිධානය බවයි.

## ■ රාජ්‍යය හා ස්වේච්ඡා සමාගම් අතර ඇති වෙනස ආංශිකව විග්‍රහ කිරීම.

### ● සාමාජිකත්වය

සාමාජිකත්වය යන සාධකය මත රාජ්‍යය හා ස්වේච්ඡා සමාගම් අතර වෙනසක් ඇත. සාමාජිකත්වය යන සාධකය තව දුරටත් ආංශිකව විග්‍රහ කළ හැකිය.

සාමාජිකත්වය අනිවාර්‍ය්‍ය බාවය මත.
සාමාජිකත්වය සිමා සහිත බාවය මත.
සාමාජිකත්වයේ චලනයට ඇති පහසු අපහසු භාවය මත.
සාමාජිකත්වය තේරීම (වරණයට) ඇති අවකාශය මත.
සාමාජිකත්වයේ ප්‍රමාණය මත.

සාමාජිකත්වය අනිවාර්‍ය්‍ය භාවය මත

පුද්ගලයාට රාජ්‍යයේ සාමාජිකත්වය අනිවාර්‍ය්‍ය වන අතර ස්වේච්ඡා සමාගම් වල අනිවාර්‍ය්‍ය නැත. සෑම පුද්ගලයෙක්ම කුමන හෝ රාජ්‍යයක සාමාජිකත්වය ලැබිය යුතුමය. රාජ්‍යයක සාමාජිකත්වය නොලබා සිටීමට නොහැකිය.

**''රාජ්‍යයක සාමාජිකත්වය නොලබා සිටිය හැක්කේ දෙවියන්ට සහ තිරිසන් සතුන්ට පමණි. නොඑසේ නම් නූපන් අයට සහ මියගිය අයට පමණි''**
-ඇරිස්ටෝටල්-

ග්‍රීක මහාදාර්ශනික ඇරිස්ටෝටල්ගේ විග්‍රහයට අනුව පැහැදිලි වන්නේ පුද්ගලයාට රාජ්‍යයේ සාමාජිකත්වය අනිවාර්‍ය බවයි. නමුත් ස්වේච්ඡා සමාගම් වල සාමාජිකත්වය පුද්ගලයාට අනිවාර්‍ය නැත. ස්වකීය කැමැත්ත මත සාමාජිකත්වයට ලැබීම හෝ නොලැබීම තීරණය කල හැක.

සාමාජිකත්වයේ සීමා සහිතභාවය මත

රාජ්‍යයේ සාමාජිකත්වය සම්බන්ධයෙන් සීමාවක් පැවති මුත් ස්වේච්ඡා සමාගම් වල සාමාජිකත්වය සම්බන්ධයෙන් සීමාවක් නොමැත. සාමාන්‍ය තත්ත්වය යටතේ එක් පුද්ගලයෙකුට සාමාජිකත්වය ලැබිය හැක්කේ එක් රාජ්‍යයක පමණි. නමුත් විශේෂ වූ තත්ත්වයන් යටතේ මෙම පදනම වෙනස් වේ. එක් පුද්ගලයෙකුට රාජ්‍යයන් කිහිපයක සාමාජිකත්වය ලැබිය හැකි අවස්ථා පවතී.

**නිදර්ශන :** ආතර් සී ක්ලාක්

රාජ්‍යයක සාමාජිකත්වය සම්බන්ධයෙන් සීමාවක් පැවති මුත් ස්වේච්ඡා සමාගම් වල සාමාජිකත්වය සම්බන්ධයෙන් සීමාවක් නොමැත. ස්වකීය අභිමතය පරිදි සමාගම් කිහිපයක වුවද සාමාජිකත්වය එකවර ලබා ගත හැකිය.

සාමාජිකත්ව (මාරු කිරීමට) චලනයට ඇති පහසු අපහසු භාවය මත

රාජ්‍යයක සාමාජිකත්වය චලනයට (මාරු කිරීමට) අපහසුය. නමුත් ස්වේච්ඡා සමාගම් වල සාමාජිකත්වය මාරු කිරීම පහසු වේ. රාජ්‍යයක සාමාජිකත්වය පුද්ගලයාට උපතින්ම පහසුවෙන් හිමි වේ. නමුත් එය මාරු කිරීම ඉතා අසීරුය. නමුත් ස්වේච්ඡා සමාගම් වල සාමාජිකත්වය ඉතා පහසුවෙන් මාරු කිරීම නැවත ලබා ගැනීම පුද්ගලයාගේ අභිමතය පරිදි සිදු කළ හැකිය.

සාමාජිකත්වය වරණයට (තේරීමට ) ඇති අවකාශය මත

රාජ්‍යයක සාමාජිකත්වය තේරීමට අවකාශයක් පුද්ගලයාට නොමැත. නමුත් ස්වේච්ඡා සමාගම් වල සාමාජිකත්වය තේරීමට අවකාශයක් ඇත. උපත මත හිමිවන රාජ්‍යයේ සාමාජිකත්වය තේරීමක් සිදු කිරීමට සාමාජිකත්වය ලබන්නාට නොහැක. නමුත් ස්වේච්ඡා සමාගම් වල සාමාජිකත්වය  වරණයේ හැකියාව එම සාමාජිකයා සතුය.

සාමාජිකත්වයේ ප්‍රමාණය මත

**සාමාන්‍යය තත්ත්වය** තුළදී රාජ්‍යයක සාමාජිකත්වය සමස්තයක් ලෙස විශාල වන අතර ස්වේච්ඡා සමාගමක සාමාජිකත්වය කුඩා වේ. රාජ්‍යයේ සාමාජිකත්වයට එම රටේ සියලුම පුරවැසියන් අදාල වේ. එම නිසා රාජ්‍යයේ සාමාජිකත්වය විශාලය.

**නිදර්ශන :** ඉන්දියාවේ ජනගහනය කෝටි 100 අධිකවීම.

නමුත් ස්වේච්ඡා සමාගමක සාමාජිකත්වය රාජ්‍යයට සාපේක්ෂව විශාල අගයක් නොගනී. නමුත් **විශේෂිත තත්ත්වයන්** යටතේ විශාල සාමාජිකයන් ප්‍රමාණයක් සහිත ස්වේච්ඡා සමාගම් පැවතිය හැකිය. එම නිසා ඇතැම් විට කුඩා ජනගහනයක් සහිත රාජ්‍යයකට වඩා ඇතැම් ස්වේච්ඡා සමාගමක සාමාජික ප්‍රමාණය වැඩිවිය හැකිය.

- බලය

බලය යන කරුණ මත රාජ්‍යය හා ස්වේච්ඡා සමාගම් අතර වෙනස හඳුනා ගත හැකිය. බලය යන සාධකය තව දුරටත් ආංශිකව විග්‍රහ කළ හැකිය.

බලය නාමකරණය මත.
බලයේ ප්‍රමාණය මත.
බලය මත පදනම් වු දඬුවම් මත.
මැදිහත් වීමේ බලය මත.
බලය ක්‍රියාවට නගන උපකරණ මත.

බලය නාමකරණය මත

රාජ්‍යයේ බලය හැඳින්වීම සඳහා විශේෂ සම්මුති නාමයන් පවතී. ස්වේච්ඡා සමාගම් වල බලය හැඳින්වීම සඳහා එසේ සම්මුති නාමයන් නැත. රාජ්‍යයේ බලය **ස්වාධිපත්‍ය බලය** , **පරම බලය** , **උත්තරීතර බලය** යන නාමයන්ගෙන් හඳුන්වනු ලැබේ. නමුත් ස්වේච්ඡා සමාගම් වල බලය හැඳින්වීමට විශේෂ නාමකරණයක් නැත.

බලයේ ප්‍රමාණය මත

රාජ්‍යයට විශාල බලයක් හිමි අතර ස්වේච්ඡා සමාගම් වලට ඉතා අල්ප බලයක් හිමිය. මුලු රාජ්‍යයටම බලපාන ආකාරයට ව්‍යවස්ථාදායක , විධායක , අධිකරණ කටයුතු කිරීමේ බලය රාජ්‍යය සතු වේ. එය විශාල උත්තරීතර බලයකි. නමුත් ස්වේච්ඡා සමාගම් වලට හිමි වන්නේ තම සාමාජිකයින් කෙරෙහි යෙදවිය හැකි සීමිත බලයක් පමණි.

බලය මත පදනම් වූ දඬුවම් මත

බලය මත පදනම් ව දෙනු ලබන දඬුවම් අනුව රාජ්‍ය හා සමාගම් අතර වෙනසක් ඇත. රාජ්‍යයේ නීති කඩ කරනු ලබන ඕනෑම පුද්ගලයෙකුට හෝ පුද්ගල කණ්ඩායමකට **දඩ ගැසීම , නඩු පැවරීම , සිර ගත කිරීම, මරණ දණ්ඩනය ලබා දීම** වැනි දඬුවම් රාජ්‍ය විසින් ලබා දෙයි. අවසානිකව පුද්ගලයාගේ ජීවිතය - මරණය අතර දඬුවමක් වුවද ලබා දීමේ හැකියාව රාජ්‍යය සතුවේ. නමුත් ස්වේච්ඡා සමාගමක පවතින නීතියක් කඩ කළ විට සාමාජිකයාට දිය හැකි උපරිම දඬුවම වන්නේ සාමාජිකත්වයෙන් නෙරපීම පමණි.

බලය ක්‍රියාවට නගන උපකරණ මත

රාජ්‍යයේ බලය ක්‍රියාවට නැගීමට විශේෂිත උපකරණ පවතින අතර අන්‍ය සමාගම් වලට එසේ විශේෂිත උපකරණ නොමැත. රාජ්‍යයේ බලය ක්‍රියාවට නගන උපකරණ ලෙස **ආණ්ඩුව , හමුදාව , පොලීසිය , බන්ධනාගාර සිරමැදිරි , එල්ලුම් ගස , පෝරකය** ආදී **නෛතික උපකරණ** දැක්විය හැකිය. නමුත් සමාගම් වල බලය ක්‍රියාත්මක කිරීම සඳහා එසේ විශේෂිත උපකරණ නොමැත.

මැදිහත් වීමේ බලය මත

රාජ්‍යයට සෑම කටයුත්තක් සම්බන්ධයෙන්ම මැදිහත් වීමට බලය ඇති අතර ස්වේච්ඡා සමාගම් වලට එවැනි මැදිහත් වීමේ බලයක් නොමැත. රාජ්‍යයට ස්වේච්ඡා සමාගම් වල කටයුතු සම්බන්ධයෙන් මැදිහත් වීමට සොයා බැලීමට බලය ඇත.

නිදර්ශන : ස්වේච්ඡා සමාගමක සාමාජිකයෙකුට සිදුවන අකටයුත්තක්, අයිතීන් කඩ වීමක් , අසාධාරණයක් වැනි තත්ත්වයකදී රාජ්‍යය ඊට මැදිහත් වීම.

මෙසේ මැදිහත් වීමේ බලය රාජ්‍යය සතුව පැවතිමුත් ස්වේච්ඡා සමාගම් වලට රාජ්‍යය සම්බන්ධයෙන් පමණක් නොව , වෙනත් ස්වේච්ඡා සමාගමක කටයුත්තක් සම්බන්ධයෙන් වත් මැදිහත් වීමට බලය නොමැත.

● <u>අරමුණු (කාර්යයන් / පරමාර්ථ)</u>

අරමුණු යන සාධකය මතද රාජය සහ සමාගම් අතර පැහැදිලි වෙනසක් හඳුනා ගත හැකිය. අරමුණු යන සාධකය ආංශිකව විග්‍රහ කල හැකිය.

අරමුණුවල ස්වභාවය මත.
අරමුණු වල වැදගත්භාවය මත.
අරමුණු මත පදනම් වු ආයතනයේ ස්ථාවරභාවය මත.

<u>අරමුණු වල ස්වභාවය මත</u>

<u>රාජ්‍යයට ඇත්තේ පොදු අරමුණු වන අතර ස්වේච්ඡා සමාගම් වලට ඇත්තේ සීමිත අරමුණු පමණි.</u> රාජ්‍ය සමස්ත සමාජය ඉලක්ක කර ගනිමින් අරමුණු ක්‍රියාවට නගයි. නමුත් ස්වේච්ඡා සමාගම් විසින් තම සාමාජිකයන් කෙරෙහි පමණක් උනන්දු වෙමින් අරමුණු ක්‍රියාවට නගයි.

නිදර්ශන : ක්‍රීඩාව නගා සිටුවීම නිදර්ශනයක් ලෙස ගතහොත් රාජ්‍යයේ අරමුණ වන්නේ සමස්ත සමාජයේ ක්‍රීඩාව සංවර්ධනය කිරිම දියුණු කිරිම වේ. නමුත් ග්‍රාමීය මට්ටමින් රැස්වන ක්‍රීඩා සමාජයන්හි අරමුණ වන්නේ තම සාමාජිකයන්ගේ ක්‍රීඩා කටයුතු දියුණු කිරිම සහ සංවර්ධනය කිරීම වේ.

රාජ්‍යයේ අරමුණු ස්වභාවය <u>දේශපාලන න්‍යායානුකූලව වෙනස් වේ.</u> ලිබරල් වාදින්ට අනුව රාජ්‍යයේ අරමුණ වන්නේ පොදු යහපත ඇති කිරීමයි. නමුත් සමාජවාදීන්ට අනුව රාජ්‍යයේ පරමාර්ථය වන්නේ රාජ්‍යය පංතියක උපකරණයක් ලෙස ක්‍රියා කිරීමයි.

<u>අරමුණු වල වැදගත්භාවය මත</u>

<u>රාජ්‍යය අරමුණු වඩා වැදගත් වන අතර රාජ්‍යය අරමුණු වලට සාපේක්ෂව ස්වේච්ඡා සමාගම් වල අරමුණ වැදගත් නොවේ.</u> රාජ්‍ය අරමුණ වඩා වැදගත් වන්නේ රාජ්‍යයට ඇත්තේ පොදු අරමුණු නිසාත්, රාජ්‍යයේ අරමුණු වලට යටත්ව ස්වකීය අරමුණු ස්වේච්ඡා සමාගම් වලට ඉටු කර ගැනීමට සිදුවන නිසාත් ,රාජ්‍ය අරමුණු ඉටුවීමේ ප්‍රමාණය මත ස්වේච්ඡා සමාගම් වල අරමුණු ඉටු වීමත් නිසාය.

**නිදර්ශන** : නීතිය හා සාමය පවත්වා ගෙන යාම රාජ්‍යයේ අරමුණක් වන අතර මෙම අරමුණ ඉටුනොවන කල් හි ස්වේච්ඡා සමාගම් වල පැවැත්ම කෙරෙහි බාධා මතු වේ.

අරමුණු මත පදනම් වූ ආයතනයේ ස්ථාවර භාවය මත.

අරමුණු මත පදනම් වු ආයතනයේ ස්ථාවර භාවය මත රාජ්‍යය හා සමාගම් අතර වෙනසක් පවතී. අරමුණු මත පදනම් වී බලන කල්හි රාජ්‍ය ස්ථාවර ආයතනයක් වන නමුත් ස්වේච්ඡා සමාගම් ස්ථාවර නොවේ. එනම් ස්වේච්ඡා සමාගම්වල අරමුණ ඉටු වීමෙන් පසුව හෝ අරමුණු ඉටුවීමකින් තොරව විසිරී යාමට ඉඩ ඇත. නමුත් රාජ්‍යය එසේ අරමුණ ඉටුවීමේ ස්වභාවය මත විසිරි යන ආයතනයක් නොවේ. රාජ්‍යය ස්ථාවර ආයතනයකි.

- අධිකාරී ක්ෂේත්‍රය (ව්‍යාප්තිය - බල ප්‍රදේශය)

අධිකාරී ක්ෂේත්‍රය යන සාධකය මත රාජ්‍යය හා සමාගම් අතර වෙනස හඳුනා ගත හැකිය. අධිකාරී ක්ෂේත්‍රය තව දුරටත් ආංශිකව විග්‍රහ කළ හැකි වේ.

අධිකාරී ක්ෂේත්‍රය හඳුනා ගැනීම මත.
අධිකාරී ක්ෂේත්‍රයේ ව්‍යාප්තික සිමාව මත.
අධිකාරී ක්ෂේත්‍රය මත පදනම් වී ඇතිවන ගැටුම් මත.

අධිකාරී ක්ෂේත්‍රය හඳුනා ගැනීම මත

රාජ්‍යයක නම් අධිකාරී ක්ෂේත්‍රය ඉතා පහසුවෙන් හඳුනා ගත හැකිය. නමුත් ස්වේච්ඡා සමාගම් වල අධිකාරී ක්ෂේත්‍රය හඳුනා ගැනීම පහසු නැත. රාජ්‍යයකට අදාල බල ප්‍රදේශය පැහැදිලි දේශ සීමා වලින් බෙදා වෙන් කොට තිබේ. එම නිසා එය හඳුනා ගැනීම වඩා පහසු වේ. නමුත් ස්වේච්ඡා සමාගම් වල බල ප්‍රදේශය හඳුනා ගැනීම පහසු නැත. එම සමාගමේ සාමාජිකයන් විසිරි ඇති ප්‍රදේශ එම සමාගමට අදාළ බල ප්‍රදේශය බවට පත් වේ. එය පැහැදිලිව හඳුනා ගැනීම අපහසුය.

අධිකාරී ක්ෂේත්‍රයේ ව්‍යාප්තික සීමාව මත

රාජ්‍යයක අධිකාරී ක්ෂේත්‍රය සම්බන්ධයෙන් සීමාවක් පවතී. ස්වේච්ඡා සමාගම්වල අධිකාරී ක්ෂේත්‍රය සම්බන්ධයෙන් සීමාවක් නොමැත. රාජ්‍යයක අධිකාරී ක්ෂේත්‍රයේ ව්‍යාප්තික සීමාව එම රාජ්‍යයේ භූමි ප්‍රදේශයෙන් සීමා වේ. රාජ්‍යයක් බිහි වීම සඳහා නිශ්චිත භූමි ප්‍රදේශයක් (අධිකාරී ක්ෂේත්‍රයක්) තිබිය යුතු බව 1817 දී ලීවර් නැමැති විචාරකයා ප්‍රකාශ කලේය. නමුත් ස්වේච්ඡා සමාගම් වල බල ප්‍රදේශය සම්බන්ධයෙන් සීමාවක් නැත. එය **ප්‍රාදේශීය, ජාතික, ජාත්‍යන්තරය** දක්වාම විසිරී පවතියි.

නිදර්ශන : (ප්‍රාදේශිය මට්ටමේ ස්වේච්ඡා සමාගම්)
මරණාධාර සමිති, මහිලා සමිති, ක්‍රීඩා සමාජ, අනෝන්‍යාධාර සමිති

(ජාතික මට්ටමේ ස්වේච්ඡා සමාගම්)
බෞද්ධ මහා සම්මේලනය , Youth

(ජාත්‍යන්තර මට්ටමේ ස්වේච්ඡා සමාගම්)
සිංහ සමාජ , ජාත්‍යන්තර කම්කරු සංවිධානය

අධිකාරී ක්‍ෂේත්‍රය මත පදනම් වී ඇතිවන ගැටුම් මත

රාජ්‍යයක අධිකාරී ක්‍ෂේත්‍රය මත ගැටුම් ඇතිවිය හැකි මුත් ස්වේච්ඡා සමාගමක අධිකාරී ක්‍ෂේත්‍රය සම්බන්ධයෙන් ගැටුම් ඇති නොවේ. රාජ්‍යයක අධිකාරී ක්‍ෂේත්‍රය තුළ පැවතිය හැක්කේ එක් රාජ්‍යයකට පමණි. එයට වෙනත් රාජ්‍යයන් මිශ්‍ර වූ කල්හි ගැටුම් ඇති වේ.

නිදර්ශන : ඉන්දියාව සහ පාකිස්ථානය කාශ්මීර භූමියට ඇතිවන ගැටුම

නමුත් ස්වේච්චඡා සමාගම් රාශියක් එකම අධිකාරී ක්‍ෂේත්‍රයක් තුළ ගැටුමකින් තොරව පැවතිය හැකිය.

■ චරිත ස්වභාවය

රාජ්‍යයන් ගොඩ නැගී ඇත්තේ එක් ජාතියක් පදනම් කරගෙනය. නමුත් ජාතිය වාර්ගික කොටස් කිහිපයක එකතුවක් විය හැකිය. නමුත් දේශපාලන විද්‍යාවේදී රාජ්‍යය යන පදයෙන් අර්ථවත් වන්නේ එක් ජාතියක් යන අදහස වේ. මේ ආකාරයට රාජ්‍ය යන ආයතනය තුළින් ජාතිකත්වය සංකේතවත් වේ. නමුත් ස්වේච්ඡා සමාගම් වලින් එසේ පැහැදිලි වන කේන්ද්‍රීය චරිත ස්වභාවයක් නොමැත.

■ සමාගම් නිර්මාණය වීමට අදාල තත්ත්වයන්

සමාගම් නැමති පොදු කුලකයකට රාජ්‍යය නැමති සමාජ සංවිධානය ද අයත් වේ. නමුත් රාජ්‍යය සමාජය තුළඇති සුවිශේෂී සංවිධානයකි. සමාගම් නිර්මාණයට අදාල තත්ත්වයන් දේශපාලන විද්‍යාව අධ්‍යයනය කරන්නෙකු විසින් හඳුනාගත යුතුය.

ප්‍රාථමික සමාජය තුළ ජීවත් වූ මිනිසාගේ අවශ්‍යතා සරල විය. නමුත් සමාජය ක්‍රමිකව විකාශනය වීමත් සමගම මානවයාගේ අවශ්‍යතා සහ වුවමනාවන් අතිශයින්ම සංකීර්ණ විය. එහි උච්චතම ප්‍රතිඵලය ලෙස මිනිසුන් **රාජ්‍යය නැමැති පොදු සංවිධානය** පිහිටුවා ගැනීම පෙන්වා දිය හැකිය. රාජ්‍ය නැමති සංවිධානය නිර්මාණය කර ගැනීමට හේතු ප්ලේටෝ විසින් සිය සමූහාණ්ඩුව කෘතියේදී ඉදිරිපත් කරයි.

භෞතික අවශ්‍යතා සපුරාගැනීම.
ආරක්ෂාව.
පොදු පාලන ක්‍රමයක් ඇති කර ගැනීම.

ඇරිස්ටෝටල් දේශපාලනය (Politics) යන කෘතිය තුළදී ,

ආර්ථික අවශ්‍යතාවන්ය.
වාර්ගික සුරක්ෂිතතාවය, යන සාධක මූලික වූ බව දක්වයි.

ඉතිහාසය තුළ රාජ්‍යය නැමැති එක් පොදු සංවිධානයක් පැවතුණි. නූතනය තුළ රාජ්‍යයට අමතරව ස්වේච්ඡා සමාගම් රාශියක් හඳුනා ගත හැකිය. මිනිසුන්ගේ මූලික අවශ්‍යතා වලට අමතරව විශේෂිත අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා ස්වේච්ඡා සමාගම් නිර්මාණය විය. අවසානිකව එළඹිය හැකි පොදු නිගමනය වන්නේ සමාගම් නිර්මාණය වීමේ ආසන්නතම හේතුව ලෙස මිනිසුන්ගේ අවශ්‍යතාවයන් සහ වුවමනාවන් සංකීර්ණවීම හේතු වූ බවයි.

**රචනා ප්‍රශ්න**

## 01. 1981 - 01

පහත සඳහන් ශීර්ෂ යටතේ නූතන රාජ්‍යයේ ලක්ෂණ සාකච්ඡා කරන්න.

1. සමාජය තුළ එහි තත්ත්වය
2. සමාජයේ අන්‍යසමාගම් සමග එහි සම්බන්ධතා
3. ස්වාධිපත්‍ය
4. ආණ්ඩුව

## 02. 1983 - 01

3. රාජ්‍යය සහ ස්වේච්ඡා සමාගම් අතර වෙනස් කම් සාකච්ඡා කරන්න.

## 03. 1984 - 06

පහත සඳහන් ශීර්ෂ යටතේ රාජ්‍යය සමාජයේ ඇති ස්වේච්ඡා සමාගම් අතර වෙනසකම් ගැන අදහස් දක්වන්න.

1. සාමාජිකත්වය　　2. අරමුණු
3. බලය　　4. අධිකාරී ක්ෂේත්‍රය

## 04. 1989 - 01

"රාජ්‍යය ඉතාම බලවත් ආයතනයයි." නූතන සමාජයේ අන් සංවිධාන ඇසුරින් මෙය සාකච්ඡා කරන්න.

## 05. 1991 - 01

"රාජ්‍යය සුවිශේෂී සමාගමකි." නූතන සමාජයේ සෙසු සමාගම් ඇසුරින් මෙය සාකච්ඡා කරන්න.

## 06. 1992 - 01

රාජ්‍යය ගැන පහත ශීර්ෂ යටතේ සාකච්ඡා කරන්න.

1. සාමාජිකත්වය 2. කාර්යයන් 3. බලය

## 07. 1996 - 01

"රාජ්‍ය සමාජය තුළ දරණ ස්ථානය අසම සම වේ." මේ ප්‍රකාශය ආශ්‍රයෙන් පහත සඳහන් කරුණු විස්තර කරන්න.

1. රාජ්‍යයේ සාමාජිකත්වය
2. රාජ්‍යයේ බලය
3. රාජ්‍යයේ කාර්යයන්
4. සමාජයේ අනෙකුත් සමාගම් අතර ඇති සම්බන්ධතා

## 08. 2012 - 02 (පැරණි)

සමාජ සංවිධාන අතුරෙන් රාජ්‍යය උසස්ම සමාජ සංවිධානය ලෙස සලකන්නේ මන්ද?